දුරකථන අංක 033-2221020, 033-2226752

# ලංසු සඳහා ආරාධනයයි (IFB)

## දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - මාතර

## මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සඳහා රෝද දෙකේ ට්‍රැක්ටර් මිලදී ගැනීම

**ලංසු අංකය : P/26/36**

මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙනුවෙන් දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින්, මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සඳහා රෝද දෙකේ ට්‍රැක්ටර් මිලදී ගැනීම සඳහා යෝග්‍යතාපූර්ණ සහ සුදුසුකම් ලත් ලංසුකරුවන්ගෙන් මුද්‍රා තැබූ ලංසු කැඳවනු ලැබේ. සම්පූර්ණ විස්තර ලංසු ලේඛනයට ඇතුලත් වේ. සියලුම ලංසු පහත වගුවේ දක්වා ඇති පරිදි ලංසු ඇපකරයක් සහිතව ඉදිරිපත් කළ යුතුය.

| කොටස (Lot) | භාණ්ඩවල විස්තරය | ප්‍රමාණය | ලංසු ඇපකරය (රු.) |
|---|---|---|---|
| A කොටස | අශ්ව බල 8 භ්‍රමණ (rotary) සහිත රෝද දෙකේ අත් ට්‍රැක්ටර් | 18 | 350,000.00 |
| | අශ්ව බල 12.5 භ්‍රමණ (rotary) සහිත රෝද දෙකේ අත් ට්‍රැක්ටර් | 01 | |

2. ලංසු තැබීම ජාතික තරගකාරී ලංසු තැබීමේ (NCB) පටිපාටියට අනුව සිදු කරනු ලැබේ.

3. උනන්දුවක් දක්වන සුදුසුකම්ලත් ලංසුකරුවන්ට වැඩිදුර තොරතුරු මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ගිණුම් අංශයෙන් (දුරකථන: 041-2222718) ලබා ගත හැකි අතර, 2026 ඔක්තෝබර් 07 වන දින දක්වා වැඩ කරන දිනවල පෙ.ව. 09.00 සිට ප.ව. 03.00 දක්වා ලංසු ලේඛන නොමිලේ පරීක්ෂා කළ හැක. එමෙන්ම මෙම ලංසු ලේඛන "http://www.matara.dist.gov.lk" වෙබ් අඩවියෙන්ද පරීක්ෂා කළ හැක.

4. 1987 අංක 03 දරන පොදු කොන්ත්‍රාත් පනතට අනුව ලංසුකරුවන් ශ්‍රී ලංකා පොදු කොන්ත්‍රාත් රෙජිස්ට්‍රාර්වරයා වෙත ලියාපදිංචි විය යුතුය. ලියාපදිංචි කිරීමේ මුල් සහතිකය (PCA 03) ඉදිරිපත් කළ යුතුය.

5. ඉංග්‍රීසි භාෂාවෙන් සකස් කළ සම්පූර්ණ ලංසු ලේඛන කට්ටලයක්, 2026.09.18 සිට 2026.10.07 දක්වා රජයේ වැඩ කරන දිනවල පෙ.ව. 9.00 ත් ප.ව. 3.00 ත් අතර කාලය තුළ මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ගිණුම් අංශයේ සරප් වෙත රු. 10,000.00 ක මුදලක් ගෙවීමෙන් හෝ Gov Pay ඔන්ලයින් ගෙවීම් පද්ධතිය හරහා දිස්ත්‍රික් ලේකම්වරයා නමින් ලංකා බැංකුවේ ගිණුම් අංක 7041859 වෙත මුදල් බැර කිරීමෙන් ලබා ගත හැකිය.

6. ඉදිරිපත් කළ යුතු ලංසු ඇපකරයේ වටිනාකම රු. 350,000.00 කි. ලංසු ඇපකරය, ලංසු විවෘත කිරීමේ දිනය වන 2026.10.08 සිට 2027.02.05 දක්වා වලංගු විය යුතුය.

7. ලංසු භාරගන්නා අවසාන දිනයේ සිට 2027.01.08 (දින 91 ක්) දක්වා හෝ දීර්ඝ කරන ලද ඕනෑම කාලසීමාවක් දක්වා ලංසු වලංගු විය යුතුය.

8. පිටපත් දෙකකින් සකස් කරන ලද ලංසු ('මුල් පිටපත' සහ 'අනු පිටපත' ලෙස වෙන් වෙන්ව සටහන් කර) තනි කවරයක බහා තිසි ලෙස මුද්‍රා තබා, 2026.10.08 දින ප.ව. 2.00 ට හෝ ඊට පෙර ලැබෙන සේ "සභාපති, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මාතර" යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය. නැතහොත් මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ දිස්ත්‍රික් ලේකම්වරයාගේ නිල කාමරයේ තබා ඇති ගිණුම් අංශයේ නම සටහන් කළ ටෙන්ඩර් පෙට්ටියට අතින් ගෙනැවිත් දැමිය හැක.

9. ඔබේ මිල ගණන් අඩංගු කවරයේ ඉහළ වම් පස කෙළවරේ "මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සඳහා රෝද දෙකේ ට්‍රැක්ටර් මිලදී ගැනීම" ලෙස සටහන් කළ යුතුය.

10. ලංසු භාරගැනීම අවසන් වූ වහාම 2026.10.08 දින ප.ව. 2.15 ට මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ දිස්ත්‍රික් ලේකම්වරයාගේ නිල කාමරයේදී ලංසු විවෘත කරනු ලැබේ. ප්‍රමාද වී ලැබෙන ලංසු විවෘත නොකරම ආපසු එවනු ලැබේ.

11. පූර්ව ලංසු රැස්වීම 2026.10.01 දින පෙ.ව. 10.30 ට මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නිල සාකච්ඡා මැදිරියේදී පැවැත්වේ.

12. මෙම ප්‍රසම්පාදන ක්‍රියාවලිය සම්බන්ධයෙන් දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ තීරණය අවසාන තීරණය වේ.

13. මෙම ලංසු කැඳවීම පිළිබඳ වැඩිදුර තොරතුරු අවශ්‍ය නම් මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රධාන ගණකාධිකාරීගෙන් 041-2222235 / 041-2222718 යන දුරකථන අංක ඔස්සේ ලබා ගත හැක.

**සභාපති,**
**දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,**
**දිස්ත්‍රික් ලේකම් කාර්යාලය,**
**මාතර.**